# “ මාතෘභූමි සුරක්ෂා ”

# ඒකීය රාජ්‍යය සහ රණවිරුවන් සුරැකීමේ සංවිධාන එකමුතුව

## ஒற்றையாட்சி மற்றும் போர் வீரர்களைப் பாதுகாக்கும் அமைப்புக்களின் ஒன்றிமை

## Collective of Organizations for the Protection of War Heroes and the Unitary Sate

සුනේත්‍රා මහා දේවි පිරිවෙණ - පැපිලියාන, බොරලැස්ගමුව. / war.heroes.srilanka@gmail.com

**අනුශාසක මණ්ඩලය**

මහාචාර්ය පූජ්‍ය
**ඉඳුරාගාරේ ධම්මරතන හිමි**
මහාචාර්ය පූජ්‍ය
**මැදගොඩ අභයතිස්ස හිමි**

හිටපු නාවික හමුදාපති
අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට්
**වසන්ත කරන්නාගොඩ**

ලුතිනල් ජනරාල්
**ජගත් ඩයස්**
(විශ්‍රාමික)

මේජර් ජනරාල්
**චාගි ගාල්ලගේ**
(විශ්‍රාමික)

ආචාර්ය **ගුණදාස අමරසේකර**
ජ්‍යෙෂ්ඨ නීතිඥ
**කල්‍යානන්ද තිරාණගම**
විශේෂඥ වෛද්‍ය
**අනුලා විජේසුන්දර**
විශේෂඥ වෛද්‍ය
**අශෝක කමලදාස**
හිටපු ආණ්ඩුකාර
**අනුරාධා යහම්පත්**
විශේෂඥ වෛද්‍ය
**සකුන්තලා සෙනවිරත්න**
නිතිඥ **කනිෂ්ක විතාරණ**
නිතිඥ **දර්ශන වේරදුවගේ**
ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී
**ශමින්ද ෆර්ඩිනැන්ඩු**
ප්‍රවීණ දේශපාලන විශ්ලේෂිකා
**ශෙනාලි වඩුගේ**
ඉංජිනේරු **කීර්ති වික්‍රමරත්න**

**මෙහෙයුම් මණ්ඩලය**

වෛද්‍ය **වසන්ත බණ්ඩාර**
නීතිඥ **නුවන් බැල්ලන්තුඩාව**
නීතිඥ **මධුමාලී අල්විස්**
**සංඛ චන්දිම අභයවර්ධන**
**ශ්‍යාමේන්ද්‍ර වික්‍රමාරච්චි**
**බන්දුල අතුකෝරාල**
**නිමල් චන්ද්‍රසිරි**
මාධ්‍යවේදී **ශානිකා ශ්‍රියානන්ද**
නීතිඥ
**එස්.කේ.ඒ.එස්. සේනානායක**

**සම්බන්ධීකාරක**

ජාත්‍යන්තර කටයුතු
**යසස් ධර්මදාස**

**කැඳවුම්කරු**

රියර් අද්මිරාල්
**ඩී. කේ. පී. දසනායක**
(විශ්‍රාමික)

අතිපූජනීය මහානායක හිමිපාණන් වහන්සේලා ප්‍රමුඛ මහා සංඝරත්නය,
අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්,
විපක්ෂ නායක ඇතුළු දේශපාලන පක්ෂ නායකයන් ප්‍රමුඛ
සෙසු මහජන නියෝජිතයින් වෙතයි.

ගෞරවණීය ස්වාමීන් වහන්ස/ ගරු ජනාධිපතිතුමනි
මහත්මයාණෙනි/ මහත්මියනි,

**රණවිරුවන්ට එරෙහිව යුද අපරාධ හා ජන සංහාර චෝදනා එල්ල කිරීම සහ දඬුවම් කිරීම සඳහා නීති පැනවීම මගින් ආරක්ෂක හමුදා දුර්වල කර ඒකීය රාජ්‍ය බෙදා වෙන් කිරීමට කටයුතු කිරීම වැළැක්වීම පිළිබඳව**

විදේශීය සහ දේශීය බෙදුම්වාදී බලවේගවල මග පෙන්වීම මත ක්‍රියාත්මක වන න්‍යාය පත්‍රයකට සහ මාර්ග සිතියමකට අනුව විශ්‍රාමික සහ සේවයේ නියුක්ත ආරක්ෂක හමුදා නිලධාරීන්ට එරෙහිව යුද අපරාධ චෝදනා එල්ල කිරීම මගින් ආරක්ෂක හමුදා දුර්වල කිරීමේ සහ දුර්මුඛ කිරීමේ ක්‍රියාන්විතයක් 2015 සිට ක්‍රියාත්මක වන බව ඔබ වහන්සේලා/ ඔබතුමන්ලා පිළිගන්නවා ඇත. ඊට අමතරව යුද අපරාධ චෝදනා ක්‍රියාවලිය, ශ්‍රී ලංකාව බෙදා වෙන් කර දුර්වල කිරීම සහ දීර්ඝකාලීන ගැටුම්වලට ගොදුරු කිරීම සඳහා ක්‍රියාත්මක වන බෙදුම්වාදී න්‍යාය පත්‍රයක සහ මාර්ග සිතියමක පූර්ව කොන්දේසියක් ලෙස එකට බැඳී පවතින බවද රහසක් නොවේ.

ඒ අනුව මේ වන විට රණවිරුවන්ට යුධ අපරාධ චෝදනා ඉදිරිපත් කිරීම සහ දඬුවම් කිරීම මෙන්ම එම ක්‍රියාවලිය ශක්තිමත්ව ඉදිරියට ගෙන යාම සඳහා නීතිමය රාමු 7ක් සම්මත කර ඇත. ඒවා වරින් වර ක්‍රමානුකූලව සම්මත කිරීම තුළ මහජනයා විසින් ඊට අදාළ සමස්ත මහා පින්තූරය තේරුම් ගැනීම වළක්වා ඇත. දැනට සම්මත කර ඇති එහෙත් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොවන එම පනත් අනුපිළිවෙලින් මෙසේ දැක්විය හැක.

1. අතුරුදහන් පුද්ගලයන් පිළිබඳ කාර්යාල පනත - 2016
2. පිටුවහල් කිරීමේ සංශෝධන පනත - 2017
3. වන්දි ගෙවීම පිළිබඳ කාර්යාල පනත - 2018
4. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වැළැක්වීමේ අන්තර්ජාතික ප්‍රඥප්ති පනත 2018
5. අපරාධ කටයුතු පිළිබඳ අන්‍යෝන්‍ය සහයෝගීතා පනත 2018
6. වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ සහ සහය ලබාදීමේ පනත 2023
7. ජාතික සමගිය සහ සංහිඳියාව කාර්යාල පනත 2023

රණවිරුවන් දුර්වල කිරීමේ සහ දුර්මුඛ කිරීමේ මාර්ග සිතියමට අදාළව පනත් 9ක් තිබෙන අතර ඒ අනුව තවත් පනත් 2ක් සම්මත කළ යුතුව ඇත. ඒ අතරින් පළමුවැන්න සත්‍ය සෙවීමේ සහ ප්‍රතිසන්ධාන කොමිසම් පනත වන අතර ඒ මගින් සෙසු පනත් සියල්ල බලාත්මක කිරීම අපේක්ෂා කෙරේ. එම පනත් කෙටුම්පත පසුගිය රජය විසින් දෙවරක්ම ගැසට් කළ ද විවිධ විරෝධයන් නිසා එය සම්මත කළ නොහැකි විය. අවසන් පනත හෙවත් 9 වැන්න රණවිරුවන්ට අවසන් වශයෙන්

චෝදනා ඉදිරිපත් කර දේශීයව අධිකරණ ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සහ විදේශීයව නඩු පැවරීමේදී ජාත්‍යන්තර අධිකරණ ක්‍රියාවලිය යටතේ වෙනත් රටක අභිචෝදකයින් සමග කටයුතු කිරීම සඳහා අභිචෝදක කාර්යාලයක් පිහිටුවීමේ නීතිමය රාමුවට අදාළ වේ. එම පනත කෙටුම්පත් කිරීම සඳහා 2025.05.07 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය.

වර්තමාන ආණ්ඩුව එම පනත් දෙක සම්මත කිරීමට පෙළඹවීම මගින් රණවිරුවන් පාවාදීම සඳහා විවිධ දේශීය සහ විදේශීය බලවේග සහ පුද්ගලයින් ක්‍රියාත්මක වන බව අනාවරණය වේ. ගරු විදේශ අමාත්‍යවරයා විසින් පසුගිය පෙබරවාරි මාසයේ දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී සත්‍ය සෙවීමේ කොමිසම පිහිටුවීමට පොරොන්දු වීම මගින් ඒ බව වැඩි දුරටත් පැහැදිලි වේ. ඊට අමතරව 2024 සැප්තැම්බර් මාසයේදී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්වරිය විසින් ඉදිරිපත් කළ වාර්තාව මගින් අවධාරණය කළ පරිදි අභිචෝදක කාර්යාලය කඩිනමින් පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ගැනීම මගින් එම තත්ත්වය තවදුරටත් තහවුරු වේ.

ඊට අමතරව පළාත් සභා මැතිවරණය පැවැත්වීමෙන් පසු ආරම්භ වීමට නියමිත බෙදුම්වාදී මාර්ග සිතිමේ අවසන් සැතපුම් කිහිපය එනම් ඉඩම් සහ පොලිස් බලතල මෙන්ම මහ ඇමති අරමුදල් ආදී වශයෙන් මධ්‍යම ආණ්ඩුව සමග ගැටුම් ඇතිකරන ප්‍රඥප්ති සම්මත කිරීමේ දී අවශ්‍ය වන පූර්ව කොන්දේසියක් වන මහවැලි අධිකාරී පනත අහෝසි කිරීම මගින් උතුරු සහ නැගෙනහිර පළාත්වල භූමියෙන් 40% ක් පමණ මධ්‍යම ආණ්ඩුවේ පාලනයෙන් ගලවා පළාත් සභා පාලනයට යටත්කිරීමට යෝජනා කර ඇති බව පෙනේ. ඒ අනුව රටේ ඒකීයභාවය සහ රණවිරුවන්ගේ ආරක්ෂාව සහ ගෞරවය මෙන්ම සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවගේ සහජීවනය අපේක්ෂා කරන සංවිධාන සමූහයක් ලෙස පහත සඳහන් අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉදිරිපත් වන ලෙස එනම්, 30,000ක පමණ රණවිරුවන් ජීවිත පූජා කර සහ එවැනිම ප්‍රමාණයක් ආබාධිත තත්ත්වයට පත්වෙමින් ආරක්ෂා කළ රටේ ඒකීයභාවය සහ ආරක්ෂක හමුදාවල ශක්තිය පාවාදීම වැළැක්වීම සඳහා ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉදිරිපත් වන ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

1. **සත්‍ය සෙවීමේ කොමිසම් සභා පනත සහ අභිචෝදක කාර්යාල පනත සම්මත කිරීම අත්හිටුවීම.**

2. **මහවැලි පනත අහෝසි කර මහවැලි අධිකාරියේ ඉඩම් ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීම අත්හිටුවීම.**

3. **ආරක්ෂක හමුදා පිරිස් බලය අඩු කිරීම මගින් ආරක්ෂක හමුදා භෞතිකව දුර්වල කිරීමේ ක්‍රියාවලිය මෙන්ම ජීවිත පූජා කළ සහ ආබාධිත ආරක්ෂක හමුදා සාමාජිකයින්ගේ යැපෙන්නන්ට ලැබිය යුතු වරප්‍රසාද කප්පාදු කිරීම මගින් ආරකෂක හමුදා මානසිකව දුර්වල කිරීමේ ක්‍රියාවලිය වහාම අත්හිටුවීම සහ නිවැරදි කිරීම.**

4. **ඉන්දියානු රජය සමග ඇතිකරගෙන තිබෙන ද්විපාර්ශ්වික එකඟතාවයන් සහ අවබෝධතා ගිවිසුම් මගින් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව, දත්ත ස්වෛරීභාවය සහ බලශකති ස්වෛරීභාවය අනතුරට ලක්කිරීම මෙන්ම ඉන්දියාවේ අනුකම්පාවට යටත් කිරීමේ ක්‍රියාවලිය වැළැක්වීම සඳහා අදාළ එකඟතාවයන් පිළිබඳව නැවත සාකච්ඡා කිරීම.**

5. **ශ්‍රී ලංකාවේ සාගර කලාපය ආශ්‍රිත ජල විද්‍යා මැණුම් කටයුතු, ගවේශන කටයුතු සහ සිතියම් ගත කිරීමට අදාල පූර්ණ අයිතිය ඉන්දියානු නාවික හමුදාවේ ආධිපත්‍යයට යටත් කිරීමේ ක්‍රියාවලිය අත්හිටුවීම සහ ජාතික සමෘද්ධිය කටයුතු කමිටුව නැවත ස්ථාපනය කිරීම.**

6. **ශ්‍රී ලංකාවේ භූමිය සහ සාගර කලාපය සතු ඛණිජ සම්පත් මෙන්ම විදුලි ජනන ව්‍යාපෘතිවලට අදාලව ඉන්දියානු සමාගම්වලට විශේෂිත ඒකාධිකාරයක් ලබාදීමේ වරද නිවැරදි කිරීම.**

**7.** **ශ්‍රී ලංකාවේ රණවිරුවන්ට එරෙහිව එල්ල කළ යුධ අපරාධ චෝදනාවලට ස්වාභාවික යුක්තිය යටතේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය හමුවේ කරුණුමය සහ නීතිමය සාක්ෂි ඉදිරිපත් කරමින් විත්තිවාචකයක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.**

**8.** **දෙමළ ජන සංහාර චෝදනාව නිෂ්ප්‍රභා කිරීම සඳහා බෙදුම්වාදී ත්‍රස්තවාදීන් විසින් සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව ඝාතනය කරමින් සිදු කළ අපරාධ විශේෂයෙන්ම උතුරු සහ නැඟෙනහිර පළාත්වල සිංහල සහ මුස්ලිම් ජනතාව ජනවාර්ගික පවිත්‍ර කරනයට ලක්කිරීම ඇතුළු යුධ අපරාධ පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාවට කරුණු දැක්වීම.**

ඉහත සඳහන් කරුණු සහිත ජනසංහාර චෝදනා එල්ල කර රණවිරුවන් පාවාදීම සහ රාජ්‍යය දුර්වල කිරීම මගින් ශ්‍රී ලංකාව නම් වූ ඓතිහාසික ඒකීය රාජ්‍යය බෙදා වෙන්කිරීම සහ ඉන්දියාවේ අර්ධ යටත් විජිතයක් බවට පත් කිරීම වැළැක්විය නොහැකි බැවින්, මෙම තීරණාත්මක අවස්ථාවේදී මහා ජාතික වගකීමක් ලෙස සලකා මෙම අනතුර වලක්වා ගැනිමට ඔබවහන්සේලා/ ඔබතුමන්ලා/ මැදිහත් වන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

මේ වගට,
ඉදිරිපත් කිරීම,

ඩී. කේ. පී .දසනායක,
රියර් අද්මිරාල් (විශ්‍රාමික)
කැඳවුම්කරු,
ඒකීය රාජ්‍ය සහ රණවිරුවන් සුරැකීමේ සංවිධාන එකමුතුව.
2025.05.

**අනුමැතිය ලබා දුන් සංවිධාන සහ නියෝජිතයින්**

01. මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි
ජාතික මහජන සභාව
02. මහාචාර්ය පූජ්‍ය මැදගොඩ අභයතිස්ස හිමි
ජාතික විද්වත් භික්ෂු සංසදය
03. මහාචාර්ය පූජ්‍ය මල්වාණේ චන්දරතන හිමි
ශ්‍රී ලංකා චීන සහයෝගිතා සංගමය
04. ශාස්ත්‍රපති පූජ්‍ය ආචාර්ය හෑගොඩ විපස්සි හිමි
ථේරවාද විමර්ශන සභාව
05. පූජ්‍ය දෙහිපේ චන්දවිමල හිමි
දේශප්‍රේමී බෞද්ධ පදනම
06. පූජ්‍ය අගුලුගල්ලේ සිරි ජිනානන්ද හිමි
බෞද්ධ තොරතුරු කේන්ද්‍රය
07. හිටපු නාවික හමුදාපති අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට්
වසන්ත කරන්නාගොඩ මහතා
08. ලුතිතන් ජනරාල් (විශ්‍රාමික)
ජගත් ඩයස් මහතා
09. මේජර් ජනරාල් (විශ්‍රාමික)
චාගි ගාල්ලගේ මහතා
10. (විශ්‍රාමික) බ්‍රිගේඩියර්
අතුල ද සිල්වා මහතා
ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා වූ
සංවිධාන එකමුතුව
11. කර්නල් (විශ්‍රාමික) අනිල් අමරසේකර මහතා
ජාතික ඒකාබද්ධ කමිටුව
12. ආචාර්ය ගුණදාස අමරසේකර මහතා
ජාතික සංවිධාන එකමුතුව
13. ජ්‍යෙෂ්ඨ නීතිඥ කල්‍යානන්ද තිරාණගම මහතා
14. ජනාධිපති නීතිඥ මනෝහරද සිල්වා මහතා
15. නීතිඥ කනිෂ්ක විතාරණ මහතා
16. යසස් ධර්මදාස මහතා - ලේකම්
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය
17. අනුරාධා යහම්පත් මහත්මිය
හිටපු නැගෙනහිර පළාත් ආණ්ඩුකාර
18. වෛද්‍ය වසන්ත බණ්ඩාර මහතා
දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය
19. විශේෂඥ වෛද්‍ය අනුලා විජේසුන්දර මහත්මිය
ජයග්‍රහණය කොළඹ සංවිධානය
20. විශේෂඥ වෛද්‍ය ඉන්ද්‍රජිත් කමලදාස මහතා
දෙවන පරපුර
21. සේනක රාජපක්ෂ මහතා - සභාපති
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය - පෝලන්තය
22. ජගත් චන්ද්‍රවංශ මහතා - සභාපති
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය - රුසියාව
23. ලලිත් ප්‍රේමලාල් මහතා - සභාපති
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය - අයර්ලන්තය
24. ජයරාජ් පලිහවඩන මහතා - ලේකම්
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය
එක්සත් රාජධානිය
25. නිතිඥ නුවන් බැල්ලන්තුඩාව මහතා
නේවාසික නිත්‍ය නියෝජිත ශ්‍රී ලංකාව

26. රාජා ප්‍රනාන්දුපුල්ලේ මහතා - සභාපති
ගෝලිය ශ්‍රී ලාංකික සංසදය - ස්වීඩනය
27. සමන්ත වීරමන්ත්‍රී මහතා - ලේකම්
ගෝලිය ශ්‍රී ලාංකික සංසදය
එක්සත් අරාබි එමීර් රාජ්‍යය
28. චානක කුරේරා මහතා - සම සභාපති
ගෝලිය ශ්‍රී ලාංකික සංසදය - කැනඩාව
29. රුවන් පෙරේරා මහතා - සම සභාපති
ගෝලිය ශ්‍රී ලාංකික සංසදය - කැනඩාව
30. විජිත් වික්‍රමසිංහ මහතා - උප සභාපති
ගෝලිය ශ්‍රී ලාංකික සංසදය
එක්සත් අරාබි එමීර් රාජ්‍යය
31. ශ්‍යාමේන්ද්‍ර වික්‍රමාරච්චි මහතා
විධායක අධ්‍යක්ෂක,
ගෝලිය ශ්‍රී ලාංකික සංසදය - ශ්‍රී ලංකාව
32. කමල් ලියනගේ මහතා - ලේකම්
ගෝලිය ශ්‍රී ලාංකික සංසදය - ශ්‍රී ලංකාව
33. කුලතුංග රාජපක්ෂ මහතා
සිංහල වීර විදහන සංවිධානය
34. ආචාර්ය කීර්ති ජයසූරිය මහතා
**SPUR** සංවිධානය ඔස්ට්‍රේලියාව
35. ශෙනාලි වඩුගේ මහත්මිය
ස්වාධීන දේශපාලන විශ්ලේෂිකා
36. නීතිඥ මධුමාලි අල්විස් මහත්මිය
යුක්තිය හා පරමාධිපත්‍යය
සඳහා වූ ජනතා හඬ
37. නීතිඥ එස්. කේ. ඒ. එස්. සේනානායක මහතා
ලේකම්,
ජාතික උරුමයන් සුරැකීමේ මධ්‍යස්ථානය
38. අනුරාධ තෙන්නකෝන් මහතා
ජාතික ගොවිජන එකමුතුව
39. ප්‍රියදර්ශන බෙන්තොට ආරච්චි මහතා
ස්වදේශික ජාතික ව්‍යාපාරය
40. වසන්ත අල්විස් මහතා
මහජන යුතුකම් කේන්ද්‍රය
41. සේනාරත්න ද සිල්වා මහතා
පනස් හයේ දරුවෝ සංවිධානය
42. වෛද්‍ය සුමිත් වන්නිආරච්චි මහතා
මව්බිම ලංකා පදනම
43. මතුගම සෙනෙවිරුවන් මහතා
ජාතික උරුමයන් සුරැකීමේ සංවිධානය
44. ආචාර්ය වසන්ත පුංචිහේවා මහතා
තිසබ් සංවිධානය
45. හේවාවිතාරණගේ දයානන්ද මහතා
දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය - ප්‍රංශ ශාඛාව
46. ආචාර්ය නෙම්සිරි ජයතිලක මහතා
දේශප්‍රේමී ජාතික පෙරමුණ
47. බුද්ධික ද සිල්වා මහතා
සාම්ප්‍රදායික පොල්තෙල්
නිෂ්පාදකයින්ගේ සංගමය
48. ප්‍රියංගා කොතලාවල මහත්මිය
ලක්මව දියණියෝ සංවිධානය
49. බුද්ධික විමලසිරි මහතා
පාවහන් සහ සම්භාණ්ඩ
කර්මාන්තකරුවන්ගේ සංසදය
50. ඉංජිනේරු නිමල් තිස්ස විජයතුංග මහතා
දේශප්‍රේමී විද්වත් සංසදය
51. ඉන්දික උබේසේකර මහතා
චින්තන පදනම - ලංකා වාදය
52. අජිත් රණසිංහ මහතා
එකමුතු භූමි පුත්‍ර පෙරමුණ
53. බන්දුල අතුකෝරල මහතා
රණවිරු ජනපවුර
54. උදේනි විජේවීර මහත්මිය
කාන්තා පරපුර
55. ලහිරු හේරත් මහතා
ගොවි ජනපවුර
56. චින්දන විදුර කුමාර මහතා
සැබෑ ජාතික ව්‍යාපාරය
57. සාලිය හෙට්ටිආරච්චි මහතා
ධර්මපාල පරපුර සංවිධානය
58. අජිත් සෙනෙවිරත්න මහතා
සුපිරිසිදු රටක් රටට හෙටක් සංවිධානය
59. ජනක බෝධිනන්ද මහතා
ජාතික උරුමයන් සුරැකීමේ මහා සම්මේලනය
60. උදිත හේවානායක මහතා
ප්‍රජා අභිලාෂයන් සුරක්ෂා පදනම
55. සුනිල් පතිරණ මහතා
විදේශ ශ්‍රමික ජාලය
56. ජනක විජයපතිරත්න මහතා
නිදහස් සේවක සංගමය
ශ්‍රී ලංකන් ගුවන් සමාගම
57. ඉංජිනේරු චාරුක කරුණාරත්න මහතා
වෘත්තීය ඉංජිනේරු සංවිධානය
58. කෝසල පත්තිනිගේ මහතා
සසුන සුරකීමට ගෝලීය සිංහල එකමුතුව
59. ගාමිණී ජේදුරු ආරච්චි මහතා
ලංකා ජාතික පෙරමුණ
60. ජීවන්ත ජයතිස්ස මහතා
ශ්‍රී ලංකාවේ බොලිවේරියානු සහයෝගිතා සංසදය
61. ජේහාන් හමීඩ් මහත්මිය - මව්වරුන්ගේ ව්‍යාපාරය
62. ෂර්මිලා ගෝනවල මහත්මිය
Urban Citizen සංවිධානය

ඇමිනුම
මීට පෙර "සත්‍ය සෙවීමේ නාමයෙන් රණවිරුවන් පාවා දී රට බෙදුම්වාදී මර උගුලේ හිර කිරීම වැළැක්වීම සඳහා පෙළගැසෙමු" යන මැයෙන් පුවත්පත් මගින් ප්‍රසිද්ධ කරන ලද දැන්වීමේ පිටපතක් අමුනා ඇත.